# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 6 දරන
# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජනවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.10 යි — තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 89/80.

**ශ්‍රී ලංකාවෙහි රූපවාහිනී ප්‍රචාරක සේවය පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිටුවීම සඳහා ද, ඒ සේවය සංවර්ධනය කිරීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම සඳහා ද ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය, (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

### ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිටුවීම හා එහි සංයුතිය

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිටුවීම.**

2. (1) (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සංස්ථාවක් පිහිටුවනු ලැබේ.

(2) සංස්ථාව, (1) වන උපවගන්තිය මගින් ඊට දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු ය; තවද ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර ඒ නාමයෙන් නඩු පැවරීමත්, නඩු පවරනු ලැබීමත් කළ හැකි ය.

**සංස්ථාවේ සංයුතිය.**

3. (1) සංස්ථාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, රූපවාහිනී ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් ඉංජිනේරු විද්‍යා පිළිබඳව හෝ, නෛතික හෝ මූල්‍ය කාරණා හෝ පරිපාලනය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳව හෝ, ගුවන් විදුලි ප්‍රචාරය හා සන්නිවේදනය පිළිබඳ ක්ෂේත්‍රයෙහි, පුළුල් පළපුරුද්ද, හැකියාව හා පිළිගැනුමක් තිබේ යයි අමාත්‍යවරයාට පෙනී යන්නා වූ සාමාජිකයන් සිව් දෙනෙක් ;

(ආ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව තත්කාලයෙහි භාරව සිටින අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, ඒ සංස්ථාවේ නියෝජිතයකු විය යුතු එක් සාමාජිකයෙක් ;

(ඇ) ජාතික චිත්‍රපට සංස්ථාව තත්කාලයෙහි භාරව සිටින අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන, ඒ සංස්ථාවේ නියෝජිතයකු විය යුතු එක් සාමාජිකයෙක් ; සහ

(ඈ) අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයකු විය යුතු එක් සාමාජිකයෙක්.

2—ඒ 59968 (82/01)

(2) සංස්ථාවේ සභාපති වශයෙන් සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වන්නේ නම්; හෝ

(ආ) යම් සමාගමක (අධ්‍යක්ෂවරයකු නොවන) කොටස්කරුවකු වශයෙන් හැර, කෙලින්ම හෝ අනියම් ක්‍රමයෙන් ඔහු විසින්ම හෝ ඔහු වෙනුවෙන් හෝ ඔහුගේ ප්‍රයෝජනය තකාගත් ප්‍රතිලාභය පිණිස වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, සංස්ථාව විසින් හෝ එය වෙනුවෙන් ඇති කරනු ලබන යම් ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රයෝජනයක් දැරීම හෝ භුක්ති විඳීම කරන්නේ නම්; හෝ

(ඇ) යම් සමාගමක (අධ්‍යක්ෂවරයකු නොවන) කොටස්කරුවකු වශයෙන් හැර, කෙලින්ම හෝ අනියම් ක්‍රමයෙන්, ඔහු විසින්ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, සංස්ථාව සඳහා කෙරෙමින් තිබෙන යම් වැඩකට හෝ වැඩකින් හෝ යම් සම්බන්ධතාවක් දරන්නේ නම් හෝ යම් ප්‍රතිලාභයක් ලබන්නේ නම්; හෝ

(ඈ) යම් සමාගමක (අධ්‍යක්ෂවරයකු නොවන) කොටස්කරුවකු වශයෙන් හැර කෙලින්ම හෝ අනියම් ක්‍රමයෙන්, ඔහු විසින්ම හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු මාර්ගයෙන්, රූපවාහිනී ප්‍රචාරයෙහි හෝ රූපවාහිනී වැඩ සටහන් නිෂ්පාදනයෙහි, අලෙවි කිරීමෙහි හෝ බෙදා හැරීමෙහි නිරතව සිටින්නේ නම්

ඒ තැනැත්තා සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කරගෙන යාමට හෝ නුසුදුසු වන්නේ ය.

(4) සංස්ථාවේ සාමාජිකයකු, සංස්ථාව සමග යම් ගිවිසුමකට එළඹ ඇති හෝ සංස්ථාව සඳහා යම් වැඩක් කරමින් සිටින යම් සමාගමක (අධ්‍යක්ෂවරයකු නොවන) කොටස්කරුවකු වන අවස්ථාවක, ඔහු ඒ සමාගමෙහි දරන කොටස්වල ස්වභාවය හා ප්‍රමාණය ඔහු විසින් අමාත්‍යවරයාට අනාවරණය කරනු ලැබිය යුතු ය.

(5) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් තම ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, සෑම සාමාජිකයකුම අවුරුදු හතරක කාලයක් ධුරය දැරිය යුතු අතර ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස යළි පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(6) යම් සාමාජිකයකු මිය යාම හෝ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම සිදුවූ විට දී ඔහු වෙනුවට වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය. එවැනි සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තකු විසින් එකී සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති ධුර කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙහි නොසිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලික වශයෙන් තම ධුරයේ කාර්ය ඉටු කිරීමට සංස්ථාවේ සභාපතිවරයාට හෝ වෙනත් යම් සාමාජිකයකුට නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(8) යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍යයයි අමාත්‍යවරයා අදහස් කරන්නේ නම්, අමාත්‍යවරයා විසින්, ඒ ඉවත් කිරීමට හේතු නොදක්වා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයක් මගින්, එසේ කළ හැකි ය. තවද ඒ ඉවත් කිරීම පිළිබඳව කවර හෝ අධිකරණයක ප්‍රශ්න නොකළ යුතුය.

(9) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යොමු කළ ලිඛිත දැනුම් දීමක් මාර්ගයෙන් කවර වූ හෝ විටක දී සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(10) සංස්ථාවේ කවර වූ හෝ ක්‍රියාමාර්ගයක් හෝ කටයුත්තක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ එහි සාමාජිකයකුගේ පත්වීම සම්බන්ධයෙන් වූ යම් අක්‍රමිකතාවක් හෝ පැවතීම හේතුකොට ගෙන පමණක් නිර්බල නොවිය යුතු ය.

(11) සංස්ථාවේ රැස්වීම්, ඒ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය සහ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය පිළිබඳව, මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

4. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව තීරණය කරනු ලබන ආකාරයට සහ ගාස්තු ප්‍රමාණ අනුව සංස්ථාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ය. සංස්ථාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

5. (1) සංස්ථාවේ මුද්‍රාව සංස්ථාව භාරයේ තිබිය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

(2) සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සභාපතිවරයා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට සංස්ථාව විසින් බලය දෙනු ලැබූ සංස්ථාවේ සාමාජිකයකු සහ සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට සංස්ථාව විසින් බලය දෙනු ලැබූ සංස්ථාවේ නිලධරයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය.

6. (1) සංස්ථාව වෙත පිරිනැමුණු හෝ නියම කරන ලද හෝ පවරා දෙන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් සංස්ථාව විසින් ලියවිල්ලකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය හැකි ය. සංස්ථාවේ බලතල පැවරීම.

(2) එවැනි යම් පැවරීමක් කර තිබුණ ද, සංස්ථාව විසින් එවැනි යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ හැකි ය.

## II වන කොටස

### සංස්ථාවේ කර්තව්‍ය, බලතල සහ කාර්ය

සංස්ථාවේ කර්තව්‍ය.

7. (1) (අ) ශ්‍රී ලංකාව ඇතුළත රූපවාහිනී ප්‍රචාරක සේවයක් පවත්වා ගෙන යාම සහ එම සේවය ප්‍රවර්ධනය කිරීම සහ දියුණු කිරීම සහ මහජන හිත පිණිස වැඩ සටහන් සම්පාදනය කිරීමෙහි ලා උසස් තත්ත්වයක් පවත්වා ගෙන යාම ;

(ආ) ප්‍රචාරය කිරීම සඳහා රූපවාහිනී වැඩ සටහන් නිෂ්පාදනය කිරීමෙහි නිරතව සිටින තැනැත්තන් ලියාපදිංචි කිරීම ;

(ඇ) සංස්ථාව විසින් ප්‍රචාරය කරනු ලබන රූපවාහිනී වැඩ සටහන් විෂයෙහි අධීක්ෂණය හා පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඈ) අපනයනය කිරීම සඳහා රූපවාහිනී වැඩ සටහන් නිෂ්පාදනය කරන විදේශීය හා වෙනත් රූපවාහිනී කණ්ඩායම් විෂයෙහි අධීක්ෂණය හා පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඉ) වීඩියෝ කැසට් පාවිච්චි කිරීම විෂයෙහි සහ අපනයනය කිරීම සඳහා ඒ කැසට්වල වැඩ සටහන් සාධක නිෂ්පාදනය කිරීම විෂයෙහි අධීක්ෂණය හා පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඊ) රූපවාහිනී ප්‍රචාරය හා සම්බන්ධ කරුණු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ; සහ

(උ) මේ පනත මගින් හෝ ඒ යටතේ රූපවාහිනී ප්‍රචාරය කිරීම පිළිබඳව සංස්ථාව වෙත පිරිනැමුණු හා නියම කරන ලද බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම

සංස්ථාවේ කර්තව්‍යයන් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ සංස්ථාවේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා, සංස්ථාව විසින් ප්‍රචාරය කරනු ලබන වැඩ සටහන්, හැකිතාක් දුරට, පහත සඳහන් නියමයන්ට අනුකූල වන බවට සැහීමට පත්වීම සංස්ථාවේ යුතුකම වන්නේ ය :—

(අ) මනා රසවින්දනයට නැතහොත් ශිෂ්ටත්වයට හානිකර හෝ අපරාධ කිරීමට පොළඹවන හෝ කැළඹීමට තුඩු දෙන හෝ යම් වාර්ගික හෝ ආගමික හැඟීම්වලට හානිකර හෝ මහජන හැඟීම්වලට හානි කළ හැකි කිසිවක් ඒ වැඩ සටහනක ඇතුළත් නොකෙරෙන බව ;

(ආ) වැඩ සටහන්වල යථා පරිදි ස්ථානික, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර වශයෙන් තුලනයක් ද වැඩ සටහන්වල විෂය කරුණු අතින් තුලනයක් සහ සාමාන්‍යයෙන් උසස් ගුණ තත්ත්වයක් පවත්වාගෙන යන බව ;

(ඇ) වැඩ සටහන්වල ඇතුළත් කරනු ලබන (කවර වූ හෝ ආකාරයේ) යම් ප්‍රවෘත්ති නිසි පරිදි නිවැරදිව හා අපක්ෂපාතිව හා මහජන යහපත පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුතුව ඉදිරිපත් කරනු ලබන බව.

8. පහත සඳහන් සියලු බලතල හෝ ඒවායින් කවර වූ හෝ බලයක් සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :— සංස්ථාවේ බලතල.

(අ) රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථාන පිහිටුවීම, සංස්ථාපනය කිරීම හා මෙහෙයවීම;

(ආ) යම් ගොඩනැගිල්ලක් සහිතව හෝ රහිතව, යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් මිළට ගැනීමෙන්, බද්දට ගැනීමෙන්, අතුරු බද්දට ගැනීමෙන් හෝ අන්‍යාකාරය කින් අත්කර ගැනීම;

(ඇ) යම් රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් පාවිච්චි කිරීම සඳහා හෝ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් පරිපාලනය කරනු ලබන යම් ඉඩමක යම් රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් හෝ යම් ගොඩ නැගිල්ලක් හෝ යම් ඉදි කිරීමක් ඉදි කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම;

(ඈ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් විකිණීම, බද්දට දීම, අතුරු බද්දට දීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම;

(ඉ) මෙම පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් දේපළ අයිතිවාසිකම් හෝ වරප්‍රසාද මිළට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම;

(ඊ) සංස්ථාවේ යම් චංචල දේපළක්, අයිතිවාසිකම් හෝ වරප්‍රසාද විකිණීමෙන් හෝ අන්‍යාකාරයෙන් නියාදනය කිරීම හෝ මුදල් කිරීම හෝ අන්‍යාකාරයෙන් කටයුතු කිරීම;

(උ) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව සහ අනුමත කරනු ලැබිය හැකි යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව, වෙනත් යම් ව්‍යාපාරයක් හා එක්ව හෝ එසේ නොමැතිව, ප්‍රචාරය කිරීම සඳහා රූපවාහිනී වැඩ සටහන් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යන්නා වූ හෝ පවත්වා ගෙන යාමට අදහස් කරන්නාවූ යම් තැනැත්තකුට හෝ සංස්ථාගත කරන ලද හෝ එසේ නොමැති යම් පුද්ගල මණ්ඩලයකට, අත්තිකාරම් වශයෙන් මුදල් දීම නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් ඉහත දැක්වූ පරිදි වූ යම් තැනැත්තකුට හෝ මණ්ඩලයකට දෙන ලද යම් අත්තිකාරම් සම්බන්ධයෙන් යම් සහතික වීමක්, හානිපූරණයක් හෝ ඇපයක් දීම;

(ඍ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය සහිතව ඉදහත ලැබූ අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව, වෙනත් යම් ව්‍යාපාරයක් හා එක්ව හෝ එසේ නොමැතිව ප්‍රචාරය කිරීම සඳහා රූපවාහිනී වැඩ සටහන් සැපයීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යන හෝ පවත්වා ගෙන යාමට අදහස් කරන්නා වූ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත සංස්ථාගත කරන ලද යම් සමාගමක කොටස් හෝ ස්කන්ධ සම්බන්ධයෙන් සහභාගිවීම, ඒවා අත්කර ගැනීම, දැරීම හෝ නිකුත් කිරීම හෝ ඒවා සම්බන්ධ යෙන් අන්‍යාකාරයෙන් කටයුතු කිරීම;

(එ) රූපවාහිනී ප්‍රචාරය පිළිබඳ කාර්යයන්හි ලා ස්වාමිත්වයෙන් ඇතුළත් සෙවුම් කලා හා සංස්කෘතික කටයුතු වර්ධනය කිරීම සහ පවත්වා ගෙන යෑම ප්‍රවර්ධනය කිරීමේ සහ ඊට සහාය වීමේ කාර්යය සඳහා යෝග්‍ය යයි සිතිය හැකි ආකාර යකින් රූපවාහිනී ප්‍රචාරක සේවයේ පහසුකම් හා උප කරණ පාවිච්චි කිරීම;

(ඒ) සංස්ථාවේ නිලධරයන්ගේ පාවිච්චිය සඳහා නිවාස බද්දට ගැනීම, කුලියට ගැනීම හෝ මිලට ගැනීම හෝ ඉඩම් මිලට ගෙන නිවාස ඉදිකිරීම;

(ඔ) සංස්ථාව විසින් පවත්වාගෙන යනු ලබන යම් රූපවාහිනී ප්‍රචාරක සේවාවකට ප්‍රයෝජනවත් වේ යයි සලකනු ලැබිය හැකි වාර සංග්‍රහ හෝ වෙනත් ප්‍රකාශන පළකිරීම හෝ ඒ සඳහා මිලදීගැනීම;

(ඕ) යම් දැන්වීමක් රූපවාහිනී ප්‍රචාරයට පත් කිරීම මහජන යහපතට හේතු නොවන්නේ ද එය කවර ආකාරයකින් හෝ ප්‍රචාරය කිරීම ප්‍රතික්ෂේප කිරීම;

(ක) රූපවාහිනී ප්‍රචාරය පිළිබඳ කුසලතා වර්ධනය කිරීමේ සහ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ප්‍රජාවගේ යහපත පිණිස වන්නේ යයි සංස්ථාව සලකන සියලු දේ කිරීම; සහ

(ඛ) ඉහත කී කාර්යයන් කිසිවක් සඳහා, සංස්ථාගත කරනු ලැබූ හෝ නොලැබූ ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් ස්ථානයක වූ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග එක්ව හෝ සහයෝගයෙන් ක්‍රියා කිරීම.

## III වන කොටස

### සංස්ථාවේ කාර්ය මණ්ඩලය

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

9. (1) සංස්ථාව විසින් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන්, රූපවාහිනී ප්‍රචාරය කිරීමේ ක්ෂේත්‍රයෙහි ප්‍රවීණ හා පළපුරුදු තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, සංස්ථාව විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සංස්ථාවේ සභාපතිවරයා තම කාර්යවලට අතිරේකව අධ්‍යක්ෂ ජන රාල්වරයාගේ කාර්ය ඉටුකිරීම පිණිස පත් කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රතිපත්ති කාරණා පිළිබඳව සංස්ථාවේ සාමාන්‍ය මෙහෙයීමට යටත්ව, සංස්ථාවේ කටයුතු මෙහෙයීම ද සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම ද සංස්ථාවේ සේවානියුක්තයන් පරිපාලනය කිරීම ද අධ්‍යක්ෂ ජනරාල්වරයාට භාර වන්නේ ය.

(3) සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සංස්ථාවේ ලිඛිත අනුමතය ඇතිව, අවශ්‍ය යයි කලින් කල තමා සලකන තම බලතල, කාර්ය හෝ කර්තව්‍ය සංස්ථාවේ වෙනත් යම් සේවානියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි ය. තවද, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය එසේ පවරනු ලැබුවේ යම් සේවානියුක්තයකුට ද ඒ සේවානියුක්තයා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන වලට යටත්ව ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා—

(අ) වයස අවුරුදු හැටට එළඹුණු විට ධුරයෙන් විශ්‍රාම ගත යුතු ය;

(ආ) යම් අවස්ථාවක අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය ඇතිව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින්නේ නම්, හෝ රෝගාතුරවීම හෝ වෙනත් අශක්‍යතාවක් හේතු කොට ගෙන තම කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකිව සිටින්නේ නම්, ඔහුට තම කාර්ය නැවත ආරම්භ කිරීමට හැකිවන තෙක් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු, අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතය ඇතිව, සංස්ථාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

මුදල් කළමනාකාරවරයා.

10. (1) සුදුසුකම්ලත්, ප්‍රවීණ සහ පළපුරුදු තැනැත්තකු මුදල් කළමනාකාරවරයා වශයෙන් සංස්ථාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) රුපියල් දසලක්ෂයකට නොඅඩු මුදල් ප්‍රමාණයන් හා සම්බන්ධ මුදල් කටයුතුවල ස්වභාවය ඇති කිසිම තීරණයක් ගැනීම, මුදල් කළමනාකාරවරයා, වියදමින් උද්ගත වන මුදල් පිළිබඳ කරුණු දැක්වෙන මුදල් විශ්ලේෂණයක් ඉදිරිපත් කරතොත් මිස, සංස්ථාව විසින් නොකළ යුතු ය.

නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

11. (1) ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි සංස්ථාව සලකන වෙනත් නිලධරයන් සහ සේවකයන් සංස්ථාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව සංස්ථාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(3) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට ගිවිස ගත් යම් තැනැත්තකු සංස්ථාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සංස්ථාවට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරනු ලබන කාලයක් වශයෙන් සැලකිය යුතු ය.

(6) සංස්ථාවේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ, අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, සංස්ථාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව සංස්ථාව සහ අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් එකඟත්වයට එළඹිය හැකි විශ්‍රාම වැටුප් අසිතිවාසිකම් හෝ අර්ථ සාධක අරමුදල් අසිතිවාසිකම් සම්බන්ධයෙන් වූ නියමයන් හා කොන්දේසි ද ඇතුළු නියමයන් හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(7) සංස්ථාවේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද, රාජ්‍ය සංස්ථාවේ ද කැමැත්ත ඇතිව, සංස්ථාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව සංස්ථාව හා එකී රාජ්‍ය සංස්ථාව විසින් එකඟත්වයට එළඹිය හැකි විශ්‍රාම වැටුප් අසිතිවාසිකම් සම්බන්ධයෙන් වූ නියමයන් හා කොන්දේසි ඇතුළු නියමයන් හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) (6) වන හෝ (7) වන උපවගන්තිය අනුව යම් තැනැත්තකු සංස්ථාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලබන අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා යටත් විය යුතු ය.

12. (1) පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාව විසින්,— සංස්ථාවේ කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම සහ ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ආ) ඒ කාර්ය මණ්ඩලයේ වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම ;

(ඇ) ඒ කාර්ය මණ්ඩලයේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කිරීම ; සහ

(ඈ) ඒ කාර්ය මණ්ඩලයේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් හෝ යෝජනා ක්‍රම පිහිටුවීම සහ ඒවා විධිමත් කිරීම සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායකවීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ රීති සාදනු ලැබිය හැකි ය.

## IV වන කොටස

### මුදල්

13. (1) සංස්ථාවට සංස්ථාවේ අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) (අ) සංස්ථාවේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල සංස්ථාවට අත්තිකාරම් වශයෙන් දෙනු ලබන සියලු මුදල් ;

(ඇ) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සංස්ථාව ලබන්නා වූ සියලු මුදල් ;

(ඈ) රූපවාහිනී බලපත්‍ර නිකුත් කිරීම සඳහා සහ අලුත් කිරීම සඳහා විදුලි සන්දේශ ආඥාපනත යටතේ ඒ ඒ වර්ෂයේ දී ලැබෙන සියලු ගාස්තුවලින් අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන ගාස්තු ; සහ

(ඉ) මේ පනතින් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් සංස්ථාව විසින් අරමුදලට ගෙවීමට නියමිත වෙනත් සියලු මුදල්

සංස්ථාවේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ මේ පනතින් හෝ ඒ යටතේ සංස්ථාවේ අරමුදලින් ගෙවීමට නියමිත සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ණය ගැනීමේ බලතල.

**14.** (1) සංස්ථාව විසින් අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව, ඔහු සුදුසු යයි ඔහු අදහස් කරන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, මේ පනත යටතේ සංස්ථාවේ බැඳීම් පියවීම හෝ කාර්ය ඉටු කිරීම සඳහා සංස්ථාවට අවශ්‍ය විය හැකි මුදල් අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් තාවකාලිකව ණයට ලබා ගත හැකි ය :

එසේ වුව ද මේ උපවගන්තිය යටතේ සංස්ථාව විසින් ලබාගන්නා ලද යම් තාවකාලික ණය සම්බන්ධයෙන් ඉතිරිව ඇති මුදල්වල එකතුව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල නොඉක්මවිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව, සංස්ථාව විසින් (මෙහි මින් මතු "රූපවාහිනී සංස්ථා ස්කන්ධ" යනුවෙන් සඳහන් කරනු ලබන) ස්කන්ධ නිකුත් කිරීමෙන් තාවකාලික ණයක් මගින් හෝ වන ආකාරයෙන් පහත දැක්වෙන කාර්යවලින් කිසියම් කාර්යයක් සඳහා මුදල් ණයට ලබාගත හැකි ය :—

(අ) රූපවාහිනී ප්‍රචාරය කිරීම සඳහා සහ රූපවාහිනී ප්‍රචාරය කිරීමේ ස්ථාන සඳහා අවශ්‍ය යම් උපකරණයක් ස්ථාපනය කිරීම, පිහිටුවීම, ක්‍රියා කරවීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් වූ යම් වැඩක් මෙනුවෙන් දරන ලද යම් වියදම් පියවීම සඳහා මුදල් ප්‍රතිපාදනය කිරීම ;

(ආ) ඉහත සඳහන් කාර්ය සඳහා යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාමක් අත්කර ගැනීම ;

(ඇ) සංස්ථාව විසින් නිකුත් කරන ලද යම් ස්කන්ධ හෝ ලබාගන්නා ලද යම් ණයක් නිදහස් කිරීම ;

(ඈ) (1) වන උපවගන්තිය යටතේ තාවකාලිකව ණයට ගන්නා ලද යම් මුදලක් ආපසු ගෙවීම.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව රූපවාහිනී සංස්ථාවේ ස්කන්ධ නිකුත් කිරීම, පැවරීම, ඒ සම්බන්ධයෙන් කට යුතු කිරීම, ඒවා නිදහස් කිරීම සහ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීම.

**15.** මේ පනත යටතේ සංස්ථාවේ කර්තව්‍ය කිරීම සඳහා වහාම අවශ්‍ය නොවන්නා වූ සංස්ථාවේ සියලු මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් බලය දෙනු ලබන ආකාරයකින් හෝ එවැනි සුරැකුම්පත්වල හෝ සංස්ථාව විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ අනුමතයට යටත්ව රූපවාහිනී ප්‍රචාරය කිරීමට කෙළින්ම සම්බන්ධ කටයුතු සම්බන්ධයෙන් සංස්ථාව විසින් ආයෝජන කරනු ලැබිය හැකි ය.

**16.** (1) ලිත් වර්ෂය සංස්ථාවේ මුදල් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම.

(2) සංස්ථාවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට සංස්ථාව කටයුතු සැලසිය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සංස්ථාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

**17.** (1) කිසිම තැනැත්තකු නියමිත දින හෝ ඉන් පසු මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාව වෙත ලියාපදිංචි වී ඇත්නම් මිස ප්‍රචාරය කිරීම සඳහා රූපවාහිනී වැඩ සටහන් සාධක නිෂ්පාදනය කිරීමෙහි සහ අලෙවි කිරීමෙහි නිරත නොවිය යුතු ය : ප්‍රචාරය කිරීම සඳහා රූපවාහිනී වැඩ සටහන් සාධක නිෂ්පාදනය කිරීමෙහි සහ අලෙවි කිරීමෙහි නිරත තැනැත්තන් ලියාපදිංචි කිරීම.

එසේ වුව ද නියමිත දිනයට පෙර එවැනි නිෂ්පාදනය කිරීමක හෝ අලෙවි කිරීමක නිරත වූ යම් තැනැත්තකු එසේ ලියාපදිංචි කිරීමක් නොමැතිව, නියමිත දින සිට මාස හයක් නොඉක්මවන කාලයක් ඒ නිෂ්පාදනය කිරීමෙහි සහ අලෙවි කිරීමෙහි නිරත විය හැකිය.

(2) ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, නියමිත ආකෘතිය අනුව විය යුතු අතර, නියම කරනු ලබන ලේඛන සහ ගාස්තු ඒ සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මහජන යහපත සඳහා නියම කරනු ලබන තත්ත්වයන් පවත්වාගෙන යාමට, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරුට හෝ ලියාපදිංචි කරන ලද තැනැත්තාට නොහැකි වුවහොත්, (2) වන උප වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් මත ඉල්ලුම්කරුවකු ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පවත්නා ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම සංස්ථාව විසින් කරනු ලැබිය හැකි ය.

(4) මේ පනත යටතේ යම් තැනැත්තකු ලියාපදිංචි කරනු ලැබ ඇති අවස්ථාවක නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් සංස්ථාව විසින් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එවැනි සෑම සහතිකයක් ම, මේ වගන්තියේ (3) වන උප වගන්තියේ සඳහන් තත්ත්වයන් සහතික කරනු පිණිස නියම කරනු ලබන කොන්දේසි අඩංගු විය යුතු ය.

(5) මේ පනත යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකු එහි දක්වා ඇති යම් කොන්දේසි කඩකරමින් ක්‍රියා කරන අවස්ථාවක, ඔහුගේ සහතිකය අවලංගු කෙරෙන නියමයක් සංස්ථාව විසින් කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ නියමය කිරීමේ දින සිට දින තිහක් ඇතුළත (මෙහි මින් මතු “ ලේකම්වරයා ” යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත,

ඒ නියමයට විරුද්ධව අභියාචනයක් කරනු ලැබිය හැකි ය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

සංස්ථාව විසින් සේවා නියුක්තයන් රක්ෂණය කළ හැකි බව.

18. මේ පනත යටතේ සංස්ථාව වෙත පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක් හෝ කාර්යයක් සංස්ථාවේ සේවානියුක්තයන් විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම හේතුකොටගෙන හෝ එසේ කිරීමේ දී සිදුවන පෞද්ගලික අනතුරකින් උද්ගත වන පාඩුව කට ප්‍රතිපක්ෂව ඒ සේවානියුක්තයන් රක්ෂණය කරමින් සංස්ථාව විසින් කලින් කල රක්ෂණ ගිවිසුම්වලට ඇතුළත් විය හැකි අතර, ඒ ගිවිසුම් සම්බන්ධයෙන් ගෙවිය යුතු වාර මුදල් ගෙවනු ලැබිය හැකි ය. එසේ රක්ෂණය කරනු ලබන සේවානියුක්තයන් පිළිබඳ වර්ග, එම වර්ගවල සේවානියුක්තයන් මුහුණ දෙන අවදානම සැලකිල්ලට ගෙන සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ සංස්ථාවේ විධානය පරිදි ගන්නා ලද ක්‍රියා මාර්ගයක් සඳහා වූ ආරක්ෂාව.

19. (1) (අ) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් රීතියක් යටතේ හෝ සංස්ථාව විසින් සද්භාවයෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සංස්ථාවට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් රීතියක් යටතේ හෝ සංස්ථාවේ විධානය පරිදි හෝ සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව

කවර වූ හෝ සිවිල් හෝ අපරාධ නඩුවක් නො පවරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාව විසින් හෝ සංස්ථාවට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාව විසින් දරනු ලැබූ යම් වියදමක් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී සංස්ථාවට ගෙවන ලද හෝ සංස්ථාව විසින් අයකරගන්නා ලද යම් ගාස්තුවක් සංස්ථාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් රීතියක් යටතේ හෝ සංස්ථාවේ විධානය පරිදි හෝ කරන ලද හෝ නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඔහු විසින් දරන ලද යම් වියදම්, ඒවා එකී සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකරගන්නා ලද්දේ නම් මිස සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**20.** සංස්ථාවේ කටයුතු සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යෝජිත අත්කර ගැනීම අනුමත කර ඇති අවස්ථාවක දී, එකී දේපළ යම් පොදු කාර්යයක් සඳහා අවශ්‍ය යයි සැලකිය යුතු අතර ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ සංස්ථාවට පවරා දෙනු ලැබිය හැකි ය. සංස්ථාව සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත් කර ගැනීම.

**21.** ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් රජයේ යම් චංචල හෝ නිශ්චල දේපළක සන්තකය හා ප්‍රයෝජනය සංස්ථාවේ කාර්යය සඳහා සංස්ථාවට පවරා දීම හෝ සංස්ථාව වෙත සතු කිරීම හෝ කළ හැකි ය : චංචල වූ ද, නිශ්චල වූ ද රජයේ දේපළ සංස්ථාවේ ප්‍රයෝජනයට ලබා දිය යුතු බව.

එසේ වුව ද රජයේ ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන යටතේ රජයේ යම් නිශ්චල දේපළකට බලපාන්නා වූ කවර වූ හෝ නියමයක් අමාත්‍යවරයා විසින් නො කරනු ලැබිය යුතු ය :

එසේ ම තවදුරටත්, එවැනි දේපළක් සම්බන්ධව පාලනය ඇත්තා වූ අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව මේ වගන්තියේ ඉහතින් සඳහන් විධිවිධාන යටතේ රජයේ යම් නිශ්චල දේපළකට බලපාන්නා වූ කවර වූ හෝ නියමයක් අමාත්‍යවරයා විසින් නොකරනු ලැබිය යුතු ය.

**22.** සංස්ථාවේ කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් කලින් කලට සාමාන්‍ය හෝ විශේෂ විධානයන් ලිඛිතව කළ හැකි අතර සංස්ථාව ඒ විධානයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු ය. අමාත්‍යවරයා විසින් විධාන දිය හැකි බව.

**23.** සංස්ථාවට විරුද්ධව පවරන ලද්දා වූ කවර වූ හෝ නඩුවක දී සංස්ථාවේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකරනු ලැබිය යුතු ය. සංස්ථාවේ සාමාජිකයකුට පුද්ගලිකව හෝ ඔහුගේ දේපළට විරුද්ධව හෝ රිට් ආඥා නිකුත් කළ නොහැකි බව.

**24.** (1) පහත දැක්වෙන පරිදි සංස්ථාව වෙනුවෙන් ගිවිසුම් ඇති කර ගත හැකි ය :— ගිවිසුම්.

(අ) පුද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද්දේ නම් ලිඛිතව විය යුතු යයි නීතියෙන් නියමිත ගිවිසුමක් සංස්ථාව වෙනුවෙන් ලිඛිතව සංස්ථාවේ පොදු මුද්‍රාව යටතේ ඇති කර ගත හැකි ය ;

(ආ) පුද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද්දේ නම්, වගකීම භාර කරනු ලබන පාර්ශ්වකරුවන්ගේ අත්සන් සහිතව ලිඛිතව තිබිය යුතු යයි නීතියෙන් නියමිත ගිවිසුමක් මෙහි මින් මතුවට විධිවිධාන සලසා ඇති අන්දමට ඒ සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සංස්ථාව වෙනුවෙන් ලිඛිතව, අත්සන් තබා ඇති කර ගත හැකි ය ; තවද,

(ඇ) පුද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද්දේ නම් ලිඛිතව නොව වාචිකව ඇති කර ගන්නා ලද්දේ වුව ද නීතියෙන් වලංගු වන්නා වූ යම් ගිවිසුමක් මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති අන්දමට ඒ සඳහා යථා පරිදි බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සංස්ථාව වෙනුවෙන් වාචික ව ඇති කර ගත හැකි ය.

(2) මේ වගන්තිය ප්‍රකාර ඇති කර ගන්නා ලද ගිවිසුමක් නීතියෙන් බලාත්මක විය යුතු අතර එයින් සංස්ථාව සහ එහි අනිකුත් සියලු පාර්ශ්වකරුවන් බැඳී සිටිය යුතු ය.

(3) මේ වගන්තිය ප්‍රකාර ඇති කර ගන්නා ලද ගිවිසුමක් මේ වගන්තියෙන් එය ඇති කිරීමට බලය දී ඇති ප්‍රකාර වෙනස් කිරීම හෝ ඉන් නිදහස් වීම හෝ කරනු ලැබිය හැකි ය.

සංස්ථාව, අල්ලස් පනත යටතේ උපලේඛන ගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

25. සංස්ථාව, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ ආකාරයෙන් තේරුම් ගත යුතු ය.

සංස්ථාවේ සාමාජිකයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකිය යුතු බව.

26. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා සංස්ථාවේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් සාදනු ලබන රීති.

27. (1) මේ පනත මගින් සෑදිය යුතු යයි නියම කර ඇති හෝ සෑදීමට බලය දී ඇති සියලුම කාරණා හෝ යම් කාරණාවක් සම්බන්ධයෙන් සංස්ථාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන කවර වූ හෝ රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන තුරු බලාත්මක නොවිය යුතු ය.

රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථාන පවත්වාගෙන යාම තහනම් කිරීම.

28. (1) මේ පනත යටතේ පිහිටුවනු ලබන සංස්ථාව හැර වෙනත් කිසිම තැනැත්තකු විසින්, ඒ තැනැත්තා අමාත්‍යවරයාගෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති නම් මිස, රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පවත්වාගෙන නොයා යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සංස්ථාව විමසා, පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙනයාම සඳහා යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන තැනැත්තකුට, පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයක් පිහිටුවීමේ හා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා යුක්තිසහගතව අවශ්‍ය විය හැකි යම් කාර්මික, මුදල් හා වෘත්තීය සුදුසුකම් ඇති බවට සෑහීමට පත්වන්නේ නම් මිස අමාත්‍යවරයා විසින් කිසිම බලපත්‍රයක් නිකුත් නොකරනු ලැබිය යුතු ය.

**29.** (1) සංස්ථාව විසින් රූපවාහිනී ප්‍රචාරය සම්බන්ධයෙන් තමන් වෙත යොමු කරනු ලැබිය හැකි කාරණා සම්බන්ධයෙන් සංස්ථාවට උපදෙස් දීමට උපදේශක කමිටු එකක් හෝ වැඩි ගණනක් පිහිටුවීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. රූපවාහිනී ප්‍රචාරය සම්බන්ධ කාරණාවල දී සංස්ථාවට උපදෙස් දීමට කමිටු පිහිටුවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් උපදේශක කමිටුවේ හෝ කමිටුවල සාමාජිකයන්ට ගෙවිය හැකි පාරිශ්‍රමික නියම කරනු ලැබිය හැකි ය.

**30.** (අ) මේ පනත යටතේ හෝ මෙ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක කාර්ය සඳහා කරන හෝ සපයන යම් වාර්තාවක හෝ ලියවිල්ලක දැනුවත්ව යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නා වූ; හෝ වැරදි.

(ආ) මේ පනත හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් ඔහු විසින් සැපයිය යුතු යයි නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නා වූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ; හෝ

(ඇ) මේ පනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යක් මගින් හෝ ඒ යටතේ හෝ තමාට පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක්, කාර්ය යක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කරන, ඉටු කරන හෝ කරන යම් නිලධරයකුට ඕනෑකමින් ප්‍රතිරෝධය දක්වන්නා වූ හෝ බාධා කරන්නා වූ; හෝ

(ඈ) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩකරන්නා වූ හෝ එයට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වර යකු ඉදිරියේ නඩු විභාගයක දී වරදකරු කිරීමෙන් පසු රුපියල් පන්සියයක් නොඉක්මවන්නා වූ දඩයකට ඔහු යටත් විය යුතු ය.

**31.** (1) නියමිත සියලුම කාරණාවලට හෝ යම් කාරණාවකට අදාළව හෝ නියෝග සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති කාරණාවලට අදාළව අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු අතර එසේ පළ කිරීමේ දිනයේ හෝ එහි නිශ්චිතව දක්වා ඇති පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද සෑම නියෝගයක් ම එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකෙන දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"නියමිත" යන්නෙන් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග මඟින් නියමිත බව අදහස් වේ;

"පුද්ගලික රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානය" යන්නෙන් සංස්ථාව හැර, වෙනත් තැනැත්තකු විසින් පිහිටුවනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන රූපවාහිනී මධ්‍යස්ථානයක් අදහස් වේ;

"රූපවාහිනී ප්‍රචාරය" යන්නට කේබල් රූපවාහිනිය ඇතුළත් වන නමුදු ගුවන් විදුලි වැඩ සටහන් ප්‍රචාරය කිරීම ඇතුළත් නොවේ;

"රූපවාහිනී වැඩ සටහන" හෝ "වැඩ සටහන්" යන්නට මහජනයා විසින් ප්‍රතිග්‍රහණය කරනු ලැබීම සඳහා රූපවාහිනී ප්‍රචාරක මධ්‍යස්ථානයකින් ප්‍රචාරය කරනු ලබන හෝ ප්‍රචාරය කිරීමට අදහස් කරනු ලබන හෝ යම් සංඥාවක්, නිවේදනයක්, විෂයයක්, දැනුම්දීමක්, චිත්‍රයක් හෝ වෙනත් යම් දෙයක් ඇතුළත් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 60 යි. (විදේශීය) රු. 80 යි, කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය